# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1996 අංක 13 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1996 ජූලි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1996 අංක 13 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 09 වන දින.]

එල්. ඩී.—ඕ. 2/95

**රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ ආඥාපනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 13 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(283 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(ඇ) සංස්ථාවේ කිසිම සාමාජිකයකු අඛණ්ඩව අවුරුදු තුනකට වැඩි කාලයක් ධුරය නොදැරිය යුතු බවට සහ සාමාජිකයන් සේවයේ යෙදී සිටිත් නම් ඔවුන් කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාව ඇතුළත හෝ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවේ පරිපාලන සීමාව ඇතුළත ස්ථානගතව සිටින නිලධරයන් විය යුතු ය යන කොන්දේසියට යටත්ව, සංස්ථාවේ සාමාජිකයන් එකොළොස් දෙනකු අවුරුද්දකට වරක් වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා, අවුරුදු තුනේ කාලසීමාව, සාමාජිකයා පළමුවන වරට පාලන කමිටුවට තෝරා පත් කර ගනු ලැබූ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනයෙන් ආරම්භව සාමාජිකයා පළමුවන වරට තෝරා පත් කර ගනු ලැබූ දින සට පසුව එළඹෙන තුන්වන වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දිනයෙන් අවසන් වන බව සලකනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ "කොළඹ මහ නගර සභාව" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වචන වෙනුවට "කොළඹ මහ නගර සභාව හෝ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවේ පරිපාලන සීමාව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *(ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(අ) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ අතුරු විධානයෙහි "නොඉක්මවිය යුතු ය; සහ" යන වචන වෙනුවට "නොඉක්මවිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන් ;

2—ඩ 038778—5,480 (96/01)

(ආ) ඒ ඡේදයේ (v) වන අනුඡේදයේ "උත්සව පැවැත්වීම" යන වචන වෙනුවට "උත්සව පැවැත්වීම, සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ ඡේදයේ (v) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

"(vi) සංස්ථාවේ රීතිවලට යටත්ව, පදිංචිය සඳහා හෝ පදිංචිය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිලට ගැනීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "සාමාජිකයන් පනස් දෙනකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ අභියෝජනාව" යන වචන වෙනුවට "සාමාජිකයන් දෙසිය දෙනකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ අභියෝජනාව" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.